# පරීක්ෂකගේ වාර්තාව

## AA3 විභාග පරීක්ෂණය - 2017 ජූලි

## (AA34) ක්‍රියාවලීන්, පාලකයන් සහ විගණනය

**පොදු කරුණු:**

ක්‍රියාවලීන්, පාලනයන් හා විගණනයෙහි (AA34) ස්ව-අධ්‍යයන ග්‍රන්ථය මත පදනම්ව අනිවාර්ය ප්‍රශ්න නවයක් ඇතුළත් වේ. මෙහි කාණ්ඩ 3 ක් තිබේ. A කොටසෙහි එකකට ලකුණු පහ (05) බැගින් වූ අනිවාර්ය ප්‍රශ්න හතරක් අඩංගු වේ. B කොටසෙහි එකකට ලකුණු දහය (10) බැගින් වූ අනිවාර්ය ප්‍රශ්න තුනක් අඩංගු වේ සහ C කොටසෙහි එකකට ලකුණු විසිපහ (25) බැගින් වූ අනිවාර්ය ප්‍රශ්න දෙකක් අඩංගු වේ.

මුළු ප්‍රශ්න පත්‍රයම ස්ව-අධ්‍යයන ග්‍රන්ථය මත පදනම් වූ අතර එහිදී අයඳුම්කරුවන්ගේ න්‍යායාත්මක දැනුම හා එය ප්‍රායෝගික පරිසරයක් තුළ යෙදවීම් පිළිබඳව පරීක්ෂා කර ඇත. අයඳුම්කරුවන් අධ්‍යයන ග්‍රන්ථය මැනවින් හැදෑරීම හා ඒවා ප්‍රායෝගිකව යෙදීම සම්බන්ධයෙන් වූ පසුගිය ප්‍රශ්න පත්‍ර සිදුකර තිබුණේ නම් ඔවුන්ට පහසුවෙන්ම මෙම ප්‍රශ්න පත්‍රය සඳහා සමත්වීමේ මායිමට ළඟා වීමට හැකියා තිබුණි.

අයඳුම්කරුවන්ගේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතිණි. ඉහළ ලකුණු ආරක්ෂා කර ගත් අයඳුම්කරුවන් සැළකිය යුතු සංඛ්‍යාවක් සිටි අතර ඉන් හැඟවෙන්නේ එම අයඳුම්කරුවන් ස්ව-අධ්‍යයන ග්‍රන්ථවල ලබා දී ඇති න්‍යායාත්මක දැනුම අධ්‍යයනය කර හා අවබෝධ කර ගෙන ඇති බව හා ඒවා සැබෑ ව්‍යාපාර හා විගණන පරිසරය තුළ යොදවා ඇති බවයි. තවදුරටත්, මෙහිදී අඩු ලකුණු ලබාගත් අයඳුම්කරුවන් සැළකිය යුතු සංඛ්‍යාවක් සිටියහ. ඔවුන්ගේ උත්තර මත පදනම්ව නිරීක්ෂණය වූයේ ඔවුන් ස්ව-අධ්‍යයන ග්‍රන්ථ අධ්‍යයනය හා පසුගිය ප්‍රශ්න පත්‍ර සිදුකර නොමැති බවයි. ඔවුන් එසේ සිදුකළා නම් ඔවුන්ට පහසුවෙන් ලකුණු 50 (පනහක්) ලබාගත හැකිව තිබුණි. බහුතර අයඳුම්කරුවන් සංඛ්‍යාවක් සියලුම ප්‍රශ්න සඳහා උත්තර සපයා ඇත. කෙසේ නමුත් ප්‍රශ්නවල ඇතැම් කොටස් සඳහා උත්තර ලබා දී නොතිබුණු බව නිරීක්ෂණය විය. එසේ පිළිතුරු ලබා නොදුන් ප්‍රශ්න ප්‍රධාන වශයෙන්ම දුර්වල කාල කලමනාකරණය, දැනුම මදි බව, දුර්වල විභාග තාක්ෂණික ක්‍රම යනාදිය නිසාවෙන් බව අපි විශ්වාස කරමු. ඉහත කරුණු වලට අමතරව පහත දැක්වෙන නිරීක්ෂණයන් ඇගයීම් ක්‍රියාවලිය පුරාවටම සටහන් විය.

- විශ්ලේෂණ කුසලතාවල මද බව.
- නොසැලකිලිමත් ලෙස (කියවාගත නොහැකි) අත් අකුරු ලිවීම.
- ඉහළ ලකුණු සහිත ස්ථානවලදී කෙටි උත්තර ලිවීම.
- අඩු ලකුණු ලබාදෙන ස්ථාන වලදී දීර්ඝ උත්තර ලියා දැක්වීම.
- සිද්ධියේ දී ඇති ගැටළු හඳුනාගෙන ඇති නමුත් ප්‍රශ්නයට අනුකූලවන පරිදි උත්තර ලබාදී නොමැත.
- උත්තර සැළසුම් කර නොමැති නිසා අදාළ නොමැති උත්තරයකින් අවසාන කිරීම.
- ප්‍රශ්න පත්‍රය අවසානයේ ලබාදී ඇති කළ යුතු ක්‍රියා පද අනුගමනය නොකිරීම.
- පරීක්ෂකගේ අපේක්ෂාවන් අවබෝධ කර නොගැනීම.

# <u>A කොටස</u>

**අනිවාර්ය ප්‍රශ්න හතරකි (04)**

**ප්‍රශ්න අංක 01** (වෙන් කළ ඇති ලකුණු 05)

මෙම ප්‍රශ්නය කොටස් 2 කින් සමන්විත විය. ව්‍යාපාරයක මෙහෙයුම්වල මූලික අදියරේදී හා වර්ෂයක් ඉකුත් වීමෙන් පසු ව්‍යාපාරික අරමුණු පිළිබඳව දැනුම A කොටසින් පරීක්ෂා කරන ලදී. B කොටසින් ව්‍යාපාරයට බලපාන සමාජයීය හා සංස්කෘතික සාධක පිළිබඳ අවබෝධය පරීක්ෂා කළේය.

ප්‍රශ්නයේ සමස්ත කාර්ය සාධනය සතුටුදායක විය. ප්‍රශ්නය සඳහා සම්පූර්ණ ලකුණු ලබාගත් අයඳුම්කරුවන් සැළකිය යුතු සංඛ්‍යාවක් විය.

ලකුණු ලබාගත නොහැකි වූයේ ඔවුන් ලබාදුන් උත්තර ප්‍රශ්නයට අදාළ නොවන නිසාවෙනි. A (a) කොටසට ලබාදී ඇති අදාළ නොවන උත්තර සඳහා උදාහරණ වනුයේ ලාභ උපරිම කර ගැනීම, ආයෝජනය පියවා ගැනීම, අඩු පිරිවැයකට ආහාර සැපයීම, ව්‍යාපාර අතර තරගකාරීත්වය හඳුනා ගැනීම, පාරිභෝගික භාණ්ඩ සඳහා ඇති ඉල්ලුම අවබෝධ කර ගැනීම, ව්‍යාපාරයේ විකුණුම් වැඩි කර ගැනීම, මුදල් කළමනාකරණය, ව්‍යාපාරයට නව නිෂ්පාදන හඳුන්වා දීම යනාදියයි.

**(A) කොටසට** ද ව්‍යාපාරය සීමාසහිත සමාගමක් බවට පරිවර්තනය කිරීම, අපතය හා කසළ කලමනාකරණය, ප්‍රාග්ධන ආයෝජනය වැඩි කිරීම, පැවැත්ම, ප්‍රවර්ධන වැඩසටහන්, නව නිෂ්පාදන සොයා ගැනීම, ශිෂ්‍යයන් සමඟ හොඳ සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම යනාදී අදාළ නොවන පිළිතුරු ලබාදී තිබුණි.

**(B) කොටස,** ඇතැම් අයඳුම්කරුවන්ට ව්‍යාපාරයට බලපාන සමාජ හා සංස්කෘතික සාධක මොනවාද යන්න පිළිබඳව දැනුම නැත. එම නිසාවෙන් ක්ෂණික කෑම වලට කැමැත්ත අඩුවීම, දෙමාපියන් ළමයින්ට ක්ෂණික කෑම මිලදී ගැනීමට ඉඩ නොදීම, ආහාර සම්බන්ධයෙන් සෞඛ්‍යමය සැළකිල්ල, උපකාරක පන්තියට ආසන්නයෙන් ව්‍යාපාරය පිහිටීම, රජයේ නීති හා රෙගුලාසි වලින් වන බලපෑම යනාදී අදාළ නොවන උත්තර ලබාදී තිබුණි.

**ප්‍රශ්න අංක 02** (වෙන් කළ ඇති ලකුණු 05)

මෙම ප්‍රශ්නය කොටස් 2 කින් සමන්විත විය. A කොටසින් අවදානම් තුනී කිරීමේ ක්‍රම 2 ක් පිළිබඳ දැනුම සහ B කොටසින් අවදානම් අඩුකර ගැනීමේ ක්‍රම සඳහා උදාහරණ 3 ක් පිළිබඳ අවබෝධය පරීක්ෂා කරන ලදී.

මෙම ප්‍රශ්නයේ සමස්ථ කාර්යසාධනය සතුටුදාක වන අතර අයඳුම්කරුවන්ගෙන් බහුතරයක් මුළු ලකුණු සුරක්ෂිත කර ගෙන ඇත. කෙසේ නමුත් ඇතැම් අයඳුම්කරුවන් A කොටස සඳහා වංචා අවදානම, පාලන අවදානම, පැහැදිලි කිරීමේ අවදානම, අවදානමට ප්‍රවේශය, තක්සේරු කළ අවදානමට ප්‍රතිචාර දැක්වීම, අනුමත සීමාවන් පිහිටුවීම, ඍණ අවදානම් පවත්වා ගැනීම, අවස්ථානුකූල අවදානම, සිදුවීමට පෙර අවදානම හඳුනා ගැනීම, ගණුදෙනුවල ඇති අවදානම, ඇගයීමේදී ඇති අවදානම යනාදී අදාළ නොවන තොරතුරු ලබාදී ඇත.

**B කොටස** අවදානම අඩු කරන්නේ කෙසේද යන්න සඳහා විගණනයේදී අවදානම් තක්සේරු කිරීම හඳුනා ගැනීම, අවදානම් පාලනය, මූල්‍ය විධායක විසින් ගෙවීම් අනුමත (බලානුගත) කිරීම, අවදානම මඟහරවා ගැනීම සඳහා විගණන විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම, ප්‍රශ්නය විශ්ලේෂණය කිරීම, අවදානම සිදුවීමට පෙර ක්‍රියාත්මක වීම, අවදානම අඩුකරගැනීම සඳහා ශේෂ සැසඳුම් සකස් කිරීම යනාදී අදාළ නොවන පිළිතුරු ලබාදී තිබුණි.

**ප්‍රශ්න අංක 03** (වෙන් කරන ලද ලකුණු 05)

මෙම ප්‍රශ්නය කොටස් 2 කින් සමන්විත විය. A කොටසින් අයදුම්කරුවන්ගේ වෘත්තීය සංශය දෘෂ්ටිය යන පදය පිළිබඳව දැනුම පරීක්ෂා කළ අතර B කොටසින් විගණකයකු විසින් වෘත්තීය විනිශ්චය ව්‍යවහාර කළ යුතු විගණනයේ ක්ෂේත්‍ර 3 ක් පිළිබඳව අයදුම්කරුවන්ගේ අවබෝධය පරීක්ෂා කරන ලදී.

A කොටස - සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතිණි. A කොටස සඳහා සැළකිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාවක්ම ඉහළ ලකුණු සුරක්ෂිත කර ගැනීමට හැකි විය. කෙසේ නමුත් "වෘත්තීය සංශය දෘෂ්ටිය යනු අවංකව, ස්වාධීනව, අරමුණුගත බව, රහස්‍යගත බව හා නිපුණත්වයෙන් යුතුව කටයුතු කිරිමයි". "වෘත්තීය සංශය දෘෂ්ටිය යනු වෘත්තීය  විනිශ්චයෙන් යුතුව කටයුතු කිරීමයි", විගණන සාක්ෂි හඳුනා ගැනීම, විගණකගේ වෘත්තීය හැසිරීම, ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීම සඳහා සැලසුම් කිරීම හා කටයුතු කිරීම යනාදී අදාළ නොවන පිළිතුරු ලබා දී ඇත.

**B කොටස** - මෙම කොටස සඳහා සමස්ත කාර්යසාධනය තෘප්තිමත් නොවූ අතර අයදුම්කරුවන් කිහිප දෙනෙකු පමණක් මුළු ලකුණු ලබා ගැනීමට සමත් විය. මෙහිදී ස්ථාවර වත්කම් ස්ථාපනය සඳහා, මූල්‍ය ක්ෂේත්‍රයේදී, කළමනාකරණ ක්ෂේත්‍රයේදී, සහතිකවීමේදී, තත්ත්ව පාලනයේදී, අවදානම් කළමනාකරණයේදී, වෘත්තීය නිපුණතාවයේදී වැනි අදාළ නොවන උත්තර ලබාදී තිබුණි.

**ප්‍රශ්න අංක 04** (වෙන් කළ ඇති ලකුණු 05)

A කොටසින් විගණන ආයතනයක් විසින් පිළිපැදිය යුතු තත්ත්ව පාලන ප්‍රතිපත්ති සහ පටිපාටිවල අරමුණු පරීක්ෂා කළ අතර B කොටසින් කණිෂ්ඨ සාමාජිකයකුගේ වැඩ, කණ්ඩායමේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයකු විසින් සමාලෝචනය කිරීමේදී සහතික කරගත යුතු කරුණු 03 ක් පරීක්ෂා කර ඇත.

මෙම ප්‍රශ්නය සඳහා කාර්යසාධනය ඉතා දුර්වල විය. ඉතා සුළු අයදුම්කරුවන් සංඛ්‍යාවක් මුළු ලකුණු ලබාගැනීමට සමත් වූ අතර සැළකිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාවක් මෙම ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගැනීමට අපොහොසත් විය.

ව්‍යාපාර මෙහෙයුම් කටයුතුවල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම, පහසුවෙන් තේරුම් ගත හැකි විගණන වාර්තාවක් නිකුත් කිරීම, හොඳ මතයක් ලබාදීම සඳහා අත්දැකීම් හා සුදුසුකම් සහිත විගණකවරයන් සිටීම, ප්‍රමාණාත්මක අවප්‍රකාශන වළක්වා ගැනීම සඳහා විගණන සහයකවරුන්ගේ හැකියාව වර්ධනය කිරීම, විගණන සහායකයින්ගේ වැරදි පාලනය කිරීම, අභ්‍යන්තර පාලනයන්ගේ තත්ත්වය සහතික කිරීම, පාලනයන්ගේ කාර්යක්ෂමතාව හා සඵලදායීත්වාය තහවුරු කර ගැනීම යනාදී නොගැළපෙන උත්තර A කොටස සඳහා ලබාදී තිබිණි.

B කොටස සඳහාද, විගණන වාර්තාව සත්‍ය හා සාධාරණ බවට තහවුරු කිරීම, නීති රෙගුලාසි හා ආචාරධර්ම සංග්‍රහය සමඟ අනුගත බව, කණිෂ්ඨ සාමාජිකයන්ට ගෞරව කිරීම, සෑම විගණකයකුගේම වැඩ අවබෝධ කර ගැනීම, ජ්‍යෙෂ්ඨයන් විසින් විගණන කණිෂ්ඨයන්ගේ වැඩ විගණන සාක්ෂි සමඟ සැසඳිය යුතුය, විගණන කණිෂ්ඨයන්ගේ රහස්‍යභාවය පරීක්ෂා කළ යුතුය, ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිතයන්ට අනුව විගණනය සිදුකළ බව තහවුරු කර ගැනීම වැනි අදාළ නොවන උත්තර බොහොමයක් තිබිණි.

## B කොටස
### අනිවාර්ය ප්‍රශ්න 03 කි

**ප්‍රශ්න අංක 05** (වෙන්කරන ලද ලකුණු 10)

**A කොටස**, "සහතිකවීමේ කාර්යභාරයක්" යනු කුමක් දැයි පැහැදිලි කිරීම අයදුම්කරුවන්ගෙන් බලාපොරොත්තු වූ අතර මෙම කොටස සඳහා කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතිණි. මේ ප්‍රශ්නය සඳහා සම්පූර්ණ ලකුණු ලබාගත් අයදුම්කරුවන්ද විය. කෙසේ නමුත් සහතිකවීමේ කාර්යභාරය යන්නෙහි තේරුම අවබෝධ කර ගත නොහැකිව, මතයේ තත්ත්වය වර්ධනය කරගැනීම සඳහා සහතික වීමේ කාර්යභාරය සිදුකරනු ලබයි, සමාගමක හෝ ආයතනයක පසුගිය කාර්යසාධනය සම්බන්ධයෙන් මතයක් ප්‍රකාශ කිරීම, විශේෂ අරමුණක් සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සඳහා මතයක් ප්‍රකාශ කිරීම, පාරිසරික ගැටළු සම්බන්ධයෙන් මතයක් ලබාදීම, බැංකු ණයක් ලබා ගැනීම සඳහා සහතිකවීමක් ලබාදීමට සිදුකරන කාර්යභාරයක් ලෙස වැරදි පිළිතුරුද ලබා දී තිබිණි.

**B කොටස** සඳහා දී ඇති සිද්ධි අධ්‍යයනයේ කරුණු සැළකිල්ලට ගෙන විගණන සමාගමට අදාල කරගතහැකි යෝග්‍ය කාර්යභාර වර්ගය හඳුනා ගන්නා ලෙස ඉල්ලා තිබුණි. ප්‍රශ්නයේ මෙම කොටස සඳහා කාර්යසාධනය සතුටුදායක නොවීය. අයදුම්කරුවන්ගේ බහුතරයකට සාධාරණ සහතිකවීම හා සීමිත සහතිකවීම අතර වෙනස හඳුනා ගැනීමට නොහැකි වී ඇත. ඒ නිසාවෙන් පරීක්ෂක විසින් අපේක්ෂා කළ උත්තරය සීමිත සහතික වීම වූ අවස්ථාවලදී එවැනි අයදුම්කරුවන් සාධාරණ සහතිකවීම උත්තරය ලෙස දක්වා ඇත. එහෙයින් එවැනි වැරදි පිළිතුරු සඳහා ලකුණු ලබා නොදුනි. සිද්ධියෙන් ඉල්ලා ඇති කරුණු මත පදනම්ව විගණක කාර්යභාරය කුමක්දැයි නිශ්චිතව සඳහන් නොකරමින් අභ්‍යන්තර විගණනය, මෙහෙයුම් විගණනය, මූල්‍ය විගණනය, සම්බන්ධිත සේවා කාර්යභාරයන් වැනි අදාළ නොවන උත්තර රාශියක් ලබා දී තිබිණි.

**ප්‍රශ්න අංක 06** (වෙන් කළ ඇති ලකුණු 10)

**A කොටස,** විගණන සාක්ෂි එක් රැස් කිරීමේදී, විගණන සාක්ෂිවල විශ්වාසනීයත්වය වැඩිකර ගන්නා ආකාර 04 ක් හඳුනා දැක්වීම පරීක්ෂා කර තිබිණි. බහුතරයක් අයදුම්කරුවන් සාමාන්‍ය ලකුණු ලබා ගනිද්දී අතලොස්සක් අයදුම්කරුවන් ඉහළ ලකුණු ලබා ගැනීමට සමත් වී ඇත. මූල්‍ය ප්‍රකාශනවලින් තොරතුරු එක් රැස් කර ගැනීම, සාක්ෂි එකතු කර ගැනීම සඳහා වෘත්තීය සංශය දෘෂ්ඨිය හා වෘත්තීය විනිශ්චය යොදා ගැනීම, නියැදියේ ප්‍රමාණය වැඩිකර විගණන සාක්ෂි ලබාගැනීම සඳහා වැඩි කාලයක් ගත කිරීම, වැඩි අවදානමක් සහිත පෙදෙස් (අයිතමයන්) පරීක්ෂා කිරීම, ආචාරධර්ම සමඟ අනුගත වීම යනාදී අදාළ නොමැති පිළිතුරු ගණනාවක් තිබිණි.

**B කොටස,** දී ඇති කුඩා සිද්ධි අධ්‍යයනයේ ඇති කරුණු පදනම් කොටගෙන කල්බදු වියදමේ වැඩිවීම පිළිබඳව විගණන සාක්ෂි ලබා ගැනීම සම්බන්ධයෙන් අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කරන ලදී. දී ඇති උත්තර වලින් සටහන් වනුයේ මේ සම්බන්ධයෙන් අයදුම්කරුවන්ගේ දැනුම ඉතා දුර්වල බවයි. ඔවුන්ගෙන් බොහොමයකට ප්‍රශ්නය තේරුම්ගත නොහැකි වූ අතර ප්‍රශ්නයේ මෙම කොටස සඳහා ලකුණු ලබාගැනීමට නොහැකි වී ඇත. මූල්‍ය ප්‍රකාශනවලින් සාක්ෂි ලබාගැනීම, ගොඩනැගිල්ල පරීක්ෂා/ අධ්‍යයනය කිරීම, කළයුතු ආකාරය පැහැදිලි කිරීමකින් තොරව හුදෙක් විශ්ලේෂණය පටිපාටි යොදා ගැනීම යනාදී අසම්පූර්ණ උත්තරද සවිස්තරාත්මක පරීක්ෂා, තහවුරු කිරීමේ පටිපාටි, ගිණුම්කරණ ප්‍රමිත නිවැරදිව යෙදවීම, නෛතික නිලධාරීන්ගෙන් ප්‍රශ්න කිරීම වැනි නිශ්චිත නොවූ උත්තරද ලබාදීම නිසා ලකුණු ලබා ගත නොහැකි වූ අයදුම්කරුවන් සැළකිය යුතු සංඛ්‍යාවක් විය.

**ප්‍රශ්න අංක (07)** (වෙන් කළ ඇති ලකුණු 10)

**A කොටස** මඟින් සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සම්බන්ධයෙන් කලමනාකාරීත්වයේ වගකීම් පිළිබඳ දැනුම පරීක්ෂා කර ඇත. අයදුම්කරුවන් අතළොස්සක් පමණ ඉහළ ලකුණු පිරිනමන ලද නිවැරදි උත්තර සපයා තිබුණි. සම්බන්ධිත පාර්ශව අතර නෛතික ගනුදෙනු පවත්වාගෙන යාම කළමනාකරණයේ වගකීමක් බව, සියලුම තොරතුරු නියමාකාරව සැපයිය යුතුය, මූල්‍ය ප්‍රකාශන නියමිත වෙලාවට පත් කිරීම, විගණනයට අවශ්‍ය සියලුම තොරතුරු අවශ්‍ය වේලාවට ලබාදීම, සම්බන්ධිත පාර්ශව අතර ගනුදෙනු අදාළ පාර්ශවයන්ට සන්නිවේදනය කිරීම, යනාදී වැරදි හා අදාළ නොවන අසම්පූර්ණ උත්තර අයදුම්කරුවන් ගණනාවක් විසින් සපයා තිබුණි.

**B කොටස** මඟින් සම්බන්ධිත පාර්ශව අතර ගනුදෙනු හඳුනාගැනීම සඳහා වන විගණන පටිපාටි 5 ක් පිළිබඳ දැනුම B කොටසෙන් පරීක්ෂා කරන ලදී. ප්‍රශ්නයේ මෙම කොටසේ කාර්යසාධනය ඉතා දුර්වලය. හොඳින් අධ්‍යයනය කර තිබුණේ නම් අයදුම්කරුවන්ට මෙම කොටස සඳහා මුළු ලකුණු ලබාගත හැකිව තිබුණි. අතළොස්සක් අයදුම්කරුවන් ගණනකට මුළු ලකුණු ලබා ගැනීමට හැකි වූ අතර කළ යුතු ආකාරය පැහැදිලි කිරීමකින් තොරව විගණකයන් විසින් ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි එකතු කිරීම යන්න, සම්බන්ධිත පාර්ශව අතර ගනුදෙනුවලට සම්බන්ධ කිරීමකින් තොරව හුදෙක් භාණ්ඩ ලැබීම් පත්‍රිකා පරීක්ෂා කිරීම යනාදී වැරදි උත්තරද, සම්බන්ධිත පාර්ශව අතර ගනුදෙනු සඳහා කෙසේ යොදා ගත යුතුදැයි පැහැදිලි කිරීමකින් තොරව පාලන පරීක්ෂා, තහවුරු කිරීමේ ක්‍රියාපටිපාටි, සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ප්‍රශ්න කිරීම, සම්බන්ධිත පාර්ශවයන් සමඟ යහපත් චේතනාවෙන් ක්‍රියාකර ඇත්දැයි සළකා බැලීම වැනි නිශ්චිත නොවන උත්තර ලබාදීම නිසා බහුතරයකට ලකුණු ලබාගත නොහැකි වී ඇත.

සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සහ ශේෂ සම්බන්ධයෙන් කළමනාකාරීත්වයෙන් ලබාගැනීමට යන ලිඛිත නියෝජනය දැක්වෙන කරුණු පිළිබඳ දැනුම C කොටසෙන් පරීක්ෂා කර ඇත. මෙහි කාර්යසාධනය ඉතා දුර්වලය. කළමනාකරණය සම්බන්ධිත පාර්ශව ගනුදෙනු මත හොඳ මතයක් ප්‍රකාශ කළ යුතුය. විගණකට සම්බන්ධිත පාර්ශව අතර ගනුදෙනු පරීක්ෂා කිරීමට කලමනාකරණය විසින් කළමනාකාරිත්ව ලිඛිත නියෝජනයක් ලබාදිය යුතුය, විගණන ක්‍රියාවලිය පුරාවටම විගණකට සහායවන බව සනාථ කරමින් කළමනාකාරීත්වය විසින් ලිපියක් ලබාදිය යුතුය, සම්බන්ධිත පාර්ශව සමඟ ඇති තැන්පතු හා ජංගම ගිණුම් පිළිබඳ විස්තර යනාදී අදාළ නොවන උත්තර රාශියක් අයදුම්කරුවන්ගෙන් බහුතරයක් ලබා දී තිබුණි.

## C කොටස

**අනිවාර්ය ප්‍රශ්න 02 ක් පමණි**

**ප්‍රශ්න අංක 08** (වෙන්කර ඇති ලකුණු ගණන 25)

**<u>A කොටස</u>**

**(a) කොටස**, මෙම ප්‍රශ්නය සිද්ධි අධ්‍යයනයක් මත පදනම් විය. ද්‍රව්‍ය අධියාචනා පත්‍රිකාවක ඇතුළත් කළ යුතු වැදගත් කරුණු 03 ක් හඳුනා දක්වන ලෙස මෙහිදී ඉල්ලා තිබුණි. මෙම ප්‍රශ්නය සඳහා කාර්ය සාධනය සාමාන්‍ය මට්ටමට වඩා ඉහළින් පැවති අතර අයදුම්කරුවන්ගෙන් බොහෝමයක් ප්‍රශ්නයේ මෙම කොටස සඳහා මුළු ලකුණු ලබා ගැනීමට සමත් විය. කෙසේ වී මුත් අමුද්‍රව්‍ය වල තත්ත්වය, නිෂ්පාදනය කළ ඒකක සංඛ්‍යාව, මිලදී ගත් අයිතම වල පිරිවැය, ඒකකයක අගය, තත්ත්වය, ගබඩා වල ඇති ප්‍රමාණය යනාදී අදාළ නොවන උත්තර සැපයීම නිසා ලකුණු ලබාගත නොහැකි වූ අයදුම්කරුවන්ද සිටියේය.

**(b) (i) කොටස,** ගනුදෙනුකරුවන්ගේ ඇණවුම මත පදනම්ව නිෂ්පාදන ඇණවුම් නිකුත් කරන බව, තහවුරු කරගැනීමට කරනු ලබන විගණන පටිපාටීන් මෙහිදී පරීක්ෂා කරන ලදී. මෙය ඉතා පහසු ප්‍රශ්නයක්විය. කෙසේ නමුත් අයදුම්කරුවන්ගෙන් බහුතරයකට ඇණවුමේ ලාභදායීත්වය පරීක්ෂා කිරීම, අවලංගු වූ ඇණවුම් පරීක්ෂා කිරීම, පාරිභෝගිකයන් ඇණවුම් කළ ප්‍රමාණ සම්බන්ධයෙන් සනාථ කිරීම් ලබා ගැනීම, අත්සන් පරීක්ෂා කළ යුතුය යනාදී අදාළ නොවන උත්තර ලබාදීම නිසා ලකුණු ලබාගත නොහැකි විය.

**(b) (ii) කොටස,** වලංගු නිෂ්පාදන ඇණවුමක් තිබේනම් පමණක්, ද්‍රව්‍ය අධියාචන පත්‍රයක් නිකුත් කරන බව තහවුරු කරගැනීම සඳහා වූ විගණන පටිපාටි පරීක්ෂා කරන ලදී. ක්‍රියාවලියේ අපතය අඩු කිරීම, අත්සන් පරීක්ෂා කිරීම, පාරිභෝගික ඇණවුම් පරීක්ෂා කිරීම, ඇණවුම් සම්පූර්ණ කර ඇති බව තහවුරු කර ගැනීමට නිෂ්පාදන ඇණවුම් පරීක්ෂා කිරීම, යනාදී ප්‍රශ්නයට අදාළ නොවන උත්තරද, ප්‍රශ්නයට සම්බන්ධ කිරීමෙන් තොරව නිවැරදි කිරීමේ පාලනයන්, කලමනාකරණයෙන් විමසීම, යනාදී නිශ්චිත නොවන උත්තර අයදුම්කරුවන් ගණනාවක් ලබාදී තිබිණි.

**(b) (iii) කොටස,** ද්‍රව්‍ය නිකුත් කිරීම් ද්‍රව්‍ය අධියාචනා සමඟ ගැලපීම සඳහා වූ විගණන පටිපාටීන් පරීක්ෂා කරන ලදී. ඇණවුම් පරීක්ෂා කිරීම, අත්සන් පරීක්ෂා කිරීම, ප්‍රශ්නයට අදාළ වන ආකාරය පැහැදිලි කිරීමකින් තොරව අනාවරණය පාලනය, කළ යුතු ආකාරය හැඟවීමකින් තොරව හුදෙක් නැවත ආගණනය හා නැවත ඉටු කිරීම යන්න, කුමක් සමඟදැයි සටහන් කිරීමකින් තොරව බින් කාඩ්පත සමඟ සැසඳිය යුතුය යන්න දක්වා තිබීම යනාදී අදාළ නොවන උත්තර ගණනාවක් අයදුම්කරුවන් ලබාදී තිබුණි.

**(b) (iv) කොටස,** නිමි භාණ්ඩ ගබඩා විධායක විසින් ඉටුකරනු ලබන තුන් ආකාර ගැලපීම තහවුරු කිරීම සඳහා වූ විගණන පටිපාටි පරීක්ෂා කර ඇත. අනවශ්‍ය අයිතම ගබඩාවේ ගබඩාකිරීමෙන් වැළකීම, නිෂ්පාදන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය පරීක්ෂා කර බැලීම යනාදී අදාළ නොවන උත්තර, සවිස්තරාත්මක පරීක්ෂා, අනාවරණ පාලනයන් නැවත ආගණනය වැනි නිශ්චිත නොවන උත්තර අයදුම්කරුවන් ගණනාවක් ලබාදී තිබුණි.

**(b) (v)** විකුණුම් දෙපාර්තමේන්තුවෙන් ඉටු කරනු ලබන පාලනයන් තහවුරු කිරීම සඳහා වන විගණන පටිපාටි පරීක්ෂා කරන ලදී. ප්‍රශ්නයේ මෙම කොටස සඳහා කාර්යසාධනය ඉතා දුර්වල විය. අමතර තොග විකිණීමෙන් වැළකීම, තොගය අධිආගණනය යොදා ගන්නා ලද අමුද්‍රව්‍යවල පිරිවැය විමසීම; කරන ලද කාර්යයේ විශ්වාසවන්තතාවය හා නිවැරදිභාවය තහවුරු කිරීම යනාදී අදාළ නොවන උත්තර අයදුම්කරුවන් බොහෝමයක් ලබාදී තිබුණි.

**(c) කොටස** - අස්තිත්ත්වය සහ එහි පරිසරය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම සඳහා විගණක විසින් ඉටුකළ යුතු විගණන පටිපාටි 03 ක් පරීක්ෂා කරන ලදී. ප්‍රශ්නයේ මෙම කොටසේ කාර්යාසාධනය සාමාන්‍ය මට්ටමට වඩා ඉහළින් පැවතිණි. කෙසේ නමුත් ණයගැතියන්ගෙන් හා ණයහිමියන්ගෙන් තහවුරු කිරීමේ ලිපි කැඳවීම, අස්තිත්ත්වය සමග විගණක සමීපව කටයුතු කළ යුතුය, අස්තිත්ත්වයේ අවදානම අඩු කර ගැනීම, නියමිත වේලාවට විගණන වාර්තාව ලබාදීම යනාදී වැරදි උත්තර ලබාදීම නිසා ලකුණු ලබා ගත නොහැකි වූ අයදුම්කරුවන්ද විය.

**(d) කොටස** - දෙන ලද සමාගමේ විකුණුම් පරීක්ෂාවට ලක් කිරීමේදී අවධානය යොමු කළ යුතු මූල්‍ය ප්‍රකාශන සැදහුම් 03 ක් පරීක්ෂාවට ලක් කරන ලදී. කාර්යසාධනය සාමාන්‍ය වට්ටමට වඩා ඉහළින් තිබුණි. ප්‍රශ්නයේ මෙම කොටස සඳහා මුළු ලකුණු ලබා ගත් අයදුම්කරුවන් සැළකිය යුතු සංඛ්‍යාවක් සිටියේය. කෙසේ නමුත් සංසංදනාත්මක බව හා සුපරීක්ෂණය, මූල්‍ය ප්‍රකාශන සැදහුම් ලෙස සැලකීම නිසා ලකුණු ලබාගත නොහැකි වූ අයදුම්කරුවන් කිහිප දෙනෙකුද සිටියේය. එපමණක් නොව විකුණුම් ඉන්වොයිසි, ණයගැතියන්, පිරිවැටුම, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, ස්කන්ධයේ වෙනස් වීම, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය පරීක්ෂා කිරීම වැනි අදාළ නොවන උත්තර ද අයදුම්කරුවන් ගණනාවක් විසින් සඳහා කර තිබුණි.

## B කොටස

**B (a) කොටස,** පරිගණක යෙදවුම් සංවර්ධන තොරතුරු තාක්ෂණික පොදු පාලනයන් සඳහා උදාහරණ 02 ක් ලැයිස්තුගත කරන ලෙස මෙම ප්‍රශ්නයේදී අයදුම්කරුවන්ගෙන් ඉල්ලා තිබුණි. මෙම ප්‍රශ්නය සඳහා කාර්ය සාධනය ඉතා දුර්වල විය. අතලොස්සක් අයදුම්කරුවන් පමණක් මුළු ලකුණු ලබාගත් අතර බහුතරයක් අයදුම්කරුවන් පිටපත් අයිතිය ලබාගැනීම, එක්සෙල් (Excel) භාවිතය, බලපත්‍ර ලබාගැනීම, ප්‍රතිවෛරස මෘදුකාංග ලබා ගැනීම, ස්වංක්‍රීය ගණනය කිරීම් වැනි වූ වැරදි උත්තර ලබා දීම නිසා ලකුණු ලබාගැනීමට නොහැකි විය.

**B (b) කොටස** දත්ත ගොනුවලට අනවරස ලෙස සංශෝධන සිදුකිරීම වැළැක්වීමේ තොරතුරු තාක්ෂණික පොදු පාලනයත් 02 ක් සඳහා උදාහරණ සඳහන් කරන ලෙස මෙම ප්‍රශ්නයෙන් අයදුම්කරුවන්ගෙන් ඉල්ලා තිබුණි. රාජකාරීන් වෙන් කර දක්වීම (Seggregation of duties), කැමරා සවිකිරීම, ප්‍රධාන ස්වරය (server) හා වයිරස ආරක්ෂණයන් යොදා ගැනීම, උපස්ථ (back up), පෙන් ඩ්‍රයිව් තුළ හෝ දෘඪ තැටිවල ගබඩා කිරීම, මෘදුකාංග සක්‍රිය කිරීම වැනි අදාළ නොවන උත්තර ලබාදීම නිසා බහුතරයක් අයදුම්කරුවන්ට මෙම ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගැනීමට අසමත් වී ඇත.

**B (c) කොටස**

මෙහෙයුම්වල අඛණ්ඩතාවය සහතික කෙරෙන තොරතුරු තාක්ෂණ පොදු පාලනයන් සඳහා අදාහරණ 2 ක් සඳහන් කරන ලෙස ඉල්ලා තිබුණි. සුළුතරයක් අයදුම්කරුවන් පමණක් මුළු ලකුනු ලබාගත් අතර අයදුම්කරුවන්ගෙන් බහුතරයක් පරිගණක යාවත්කාලීන කිරීම, සියළුම හස්ත පද්ධතීන් පරිගණක ගත කිරීම, මුර පද ආරක්ෂණය, නව පරිගණක යෙදවුම් හා මෙහෙයුම් පද්ධතීන් යොදා ගැනීම, භාවිත කරනන්නන් හට වෙන වෙනම මුරපද ලබාදීම යනාදී වැරදි උත්තර ලබාදීම නිසා ප්‍රශ්නයේ මෙම කොටසට ලකුණු ලබාගෙන නැත.

**B (d) කොටස** වැඩසටහනක අනවරසර ලෙස වෙනස් කිරීම වැළැක්වීම හෝ අනාවරණය කරගැනීම සඳහා වූ තොරතුරු තාක්ෂණික පොදු පාලන සඳහන් කරන ලෙස මෙහිදී ඉල්ලා තිබුණි. කාර්යසාධනය සතුටුදායකය. කෙසේ නමුත් ගිනි නිවාරණ බිත්ති (fire wall), බලපත්‍ර ලබා ගැනීම, පරිගණක පද්ධතීන් යාවත් කාලීන කිරීම, හස්ත පද්ධතීන් පරිගණක ගත කිරීම, සාධාරණත්වය පරීක්ෂා කිරීම, අනෙකුත් යෙදවුම් පරීක්ෂා කිරීම, නව අනුවාදය ස්ථාපනය කිරීම යනාදී වැරදි උත්තර ලබාදීම නිසා ලකුණු ලබාගත නොහැකි වූ අයදුම්කරුවන්ද සිටියේය.

**ප්‍රශ්න අංක 09**
**(වෙන්කර ඇති ලකුණු 25)**

## A කොටස

දේපළ පිරියත හා උපකරණ සත්‍යාපනය කිරීම සඳහා විගණක විසින් ඉටු කරන ලබන විගණන පටිපාටි 3 ක් පරීක්ෂා කරන ලදී. මෙම ප්‍රශ්නයේ කාර්යසාධනය සාමාන්‍ය මට්ටමට වඩා ඉහළින් පැවතිණි. ඇතැම් අයදුම්කරුවන් මුළු ලකුණු ලබා ගැනීම සඳහා සාර්ථකව උත්තර සපයා තිබිණි. කෙසේ නමුත් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණයන් විශ්ලේෂණය කිරීම, පාලනය පරීක්ෂාවන් යොදා ගැනීම, ගිණුම්කරණ ප්‍රමිත යොදා ගැනීම, ස්ථාවර වත්කම් පරීක්ෂා කිරීම සඳහා තහවුරු කිරීමේ ක්‍රියාපටිපාටි යොදා ගැනීම ස්ථාවර වත්කම් විශ්ලේෂණය හා සමාලෝචන යනාදී වැරදි උත්තර ගණනාවක්ද ලබා දී තිබිණි.

**A (b) කොටස** - පාලන පරීක්ෂාවන් හා තහවුරු කිරීමේ ක්‍රියාපටිපාටි අතර වෙනස පරීක්ෂා කරන ලදී. අයදුම්කරුවන්ගෙන් බහුතරයකට සතුටුදායක උත්තර ලබාදීමට නොහැකි වූ නිසාවෙන් අඩු ලකුණු ලබා ගෙන ඇත. අතළොස්සක් පමණ අයදුම්කරුවන් පමණක් මුළු ලකුණු ලබා ගැනීම සඳහා හොඳ උත්තර දීමට සමත් වී ඇත. කෙසේ නමුත් පාලන පරීක්ෂාවක් යනු වංචා හා වැරදි ඇතිවීම වැළැක්වීමේ පාලනයක්, අභ්‍යන්තර පාලනය හා සම්බන්ධ වූවකි, තොරතුරු එකතු කිරීම ගැටළු අනාවරණය හා නිවැරදි කරගැනීමට යනාදී ලෙසද තහවුරු කිරීමේ ක්‍රියාපටිපාටියක් යනු වංචා අවම කිරීමයි, වංචා හා වැරදි තහවුරු කර ගැනීමයි, නෛතික අවශ්‍යතාවයකි, තුන්වන පාර්ශවයකින් ලබාගන්නා තහවුරු කිරීමකි. ගැටළුවක් සමාප්ත වශයෙන් විශ්ලේෂණය හා ක්‍රියාකාරකමක් තහවුරු කර ගැනීම යනාදී ලෙස විස්තර කිරීම නිසා ලකුණු ලබා ගැනීමට නොහැකි වූ අයදුම්කරුවන්ද විය.

## B කොටස

**B (a) කොටස** - සිද්ධි අධ්‍යයනයේ ඇති කරුණු හා සංඛ්‍යා, ප්‍රාග්ධන වියදම් හා ආයභාර වියදම් අතර වෙනස, පදනම්ව මූල්‍ය ප්‍රකාශන මත විගණන මතය විමසන ලෙස ඉල්ලා තිබිණි. අයදුම්කරුවන් බොහෝමයකට ප්‍රාග්ධන වියදම් හා අයභාර වියදම් අතර වෙනස හඳුනාගැනීමට නොහැකි වී ඇත. තවද ඔවුන්ට ප්‍රමාණාත්මකභාවය යන්නෙහි තේරුම ද තේරුම් ගැනීමට නොහැකි වී ඇත. රු. 2,500,000/- ක් වූ අළුත්වැඩියා වියදම අයභාර වියදමක් ලෙස හඳුනාගත යුතුව තිබුණද සමහර අයදුම්කරුවන් එය හඳුනාගෙන නොමැත. මෙම ප්‍රශ්නය සඳහා කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොපැවතිනි. මෙය ගළපා නොමැති නම් කරුණු අවධාරණය කළ යුතු බවට ඇතැම් අයදුම්කරුවන් සඳහන් කර ඇත. තවත් සමහර අයදුම්කරුවන් සඳහන් කර ඇත්තේ විගණක විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතුය යන්නයි.

**B (b) කොටස** - විගණකගේ මතය ඡේදය හැරුණු විට විගණක වාර්තාවේ මූලිකාංග 3 ක් පරීක්ෂාවට ලක් කර ඇත. මෙය ඉතා පහසු ප්‍රශ්නයකි. මෙම ප්‍රශ්නය සඳහා කාර්යසාධනය යහපත් වූ අතර සැළකිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාවක් ප්‍රශ්නයේ මෙම කොටස සඳහා මුළු ලකුණු ලබාගෙන ඇත. කෙසේ නමුත් විගණන සාක්ෂි, විගණන වැඩ පත්‍රිකා, විගණනයේ විෂය පථය, විගණක ගාස්තු සාක්ෂි එක්රැස් කිරීමේ මාර්ග යනාදී අදාළ නොවන උත්තර ගණනාවක් සැලකිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාවක් විසින් ලබා දී තිබුණි.

**C කොටස**

**C (a) කොටස** - සිද්ධි අධ්‍යයනයේ ලබාදී ඇති කරුණු මත පදනම්ව මූලික මූලධර්ම වලට අනුගත වීමේ තර්ජන 02 ක් සඳහන් කරන ලෙස ඉල්ලා තිබුණි. ප්‍රශ්නයේ මෙම කොටස සඳහා කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතිණි. මුළු ලකුණු ලබාගැනීම සඳහා සම්පූර්ණ උත්තර ලබාදුන් අයදුම්කරුවන් කිහිපදෙනෙකු සිටියේය. කෙසේ නමුත් මූල්‍ය තර්ජන, කාර්ය අවස්ථාවන් සමග ගිවිසුම්, වෘත්තීය හැසිරීම හා ස්වාධීනත්වය, කළමනාකරණය සමග ආරවුල් යනාදී වැරදි උත්තර බහුතරයක් අයදුම්කරුවන් විසින් ලබාදී තිබුණි.

**C (b) කොටස** - ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ සාමාජිකයන් අනුගත විය යුතු මූලික මූලධර්ම වන අරමුණුගත බව, වෘත්තීමය නිපුණත්වය හා වෘත්තීමය හැසිරීම පරීක්ෂාවට ලක් කර ඇත. මෙය න්‍යායාත්මක ප්‍රශ්නයක් වූ අතර ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ ආචාරධර්ම සංග්‍රහය පිළිබඳ දැනුම භාවිතා කරමින් මෙම ප්‍රශ්නයට උත්තර දිය හැකිව තිබිණ. ඇතැම් අයදුම්කරුවන් අරමුණුගත බව යනු හොඳ නිමවුමක් සැපයීම, විෂය කරුණ / පාදක කරුණ සම්බන්ධයෙන් ඇති දැනුම, වේලාවට සාධාරණ මතයක් ලබාදීම, පැහැදිලි, අවබෝධයකින් ගිණුම් සකස් කිරීම ලෙස වැරදි ආකාරයෙන් සඳහන් කර ඇත. ඔවුන් නිපුණත්වය යන්න අනෙකුත් වෘත්තිකයන් සමග තරඟ කිරීමට ඇති හැකියාව, විශ්වාසනීයබව, අවංක බව, මනා සැලකිල්ල, අනෙක් අය සමග තරඟ කිරීම ලෙස වැරදි උත්තර ලබාදී ඇත. අයදුම්කරුවන් වෘත්තීය හැසිරීම යන්න වැරදි ලෙස හඳුනාගෙන ඇත්තේ නියමානුකූල හැසිරීම, වැඩ කිරීමට ඇති නිපුණත්වය, ව්‍යාපාරික මනසක් තිබීම, යහපත් ආචාරධර්ම, නායකත්ව ගුණාංග, ආත්ම විශ්වාසය යනාදී ලෙසයි.

\- - -

**විභාගයේදී උත්තර ලිවීමේ කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා අයදුම්කරුවන්ගේ නිපුණතා මට්ටම ඉහළ නැංවීම සඳහා යෝජනා:**

- අයදුම්කරුවන් ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොත අධ්‍යයනය කොට එහි අන්තර්ගතය මනාව වටහාගත යුතුය.

- විගණන විෂයට සම්බන්ධ ලිපි, පොත්පත්, සඟරා, ආදිය පරිශීලනය කළ යුතුය.

- ප්‍රශ්න පත්‍රයට අමුණා ඇති "කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව" පිළිබඳ නිර්වචන හරිහැටි තේරුම්ගෙන එපරිදි උත්තර ලිවීමට පුරුදු පුහුණු විය යුතුය.

- පසුගිය ප්‍රශ්නපත්‍ර වල අන්තර්ගත දෑ අධ්‍යයනය කර, යටත් පිරිසෙයින් ඉකුත් වර්ෂ 5 ක ප්‍රශ්න වලටවත් උත්තර ලිවීමට පුරුදු වී, ප්‍රශ්න දී තිබෙන ආකාරය වටහා ගැනීමට උත්සාහ කළ යුතුය.

- ප්‍රශ්න පත්‍ර වල පරීක්ෂා කර ඇති න්‍යායාත්මක කරුණු යොදා ගැනීම විභාගයේදී පරීක්ෂක විසින් අපේක්ෂා කර ඇත්තේ කෙසේද යන සම්බන්ධතාවය අයදුම්කරුවන් වටහාගත යුතුය.

- ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොතේ කවර ක්ෂේත්‍රවලින් පසුගිය ප්‍රශ්න දී තිබේදැයි කෙටි සටහන් ලියාගැනීම මගින් අයදුම්කරුවන් තේරුම්ගත යුතුය.

- ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවලට කාලය වෙන්කරගෙන ඒ අනුව උත්තර ලියා පුරුදු වීමෙන් විභාගයේදී අයදුම්කරුවන්ගේ කාල කළමනාකරණය දියුණු වනු ඇත.

- ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොතේ එක් එක් පරිච්ඡේදය සඳහා කෙටි සටහන් පිළියෙළ කරගෙන විවේක ලැබෙන විධියට විෂය නිර්දේශයේ අන්තර්ගත කරුණු මතකයට නඟා ගැනීම සිදුකළ යුතුය.

- අයදුම්කරුවන් කියවීමට හැකි ආකාරයෙන් අත්අකුරු පැහැදිලිව විභාගයේදී ලිවිය යුතුය.

- ප්‍රශ්න පත්‍රයට උත්තර ලිවීම පටන්ගැනීමට පෙර අයදුම්කරුවන් ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවා බැලිය යුතුය.

- ප්‍රශ්නය නිසිලෙස තේරුම් ගැනීමටත්, ඒවාට අවශ්‍යකරන යෝග්‍ය උත්තර නිවැරදිව ලිවීමටත් පැහැදිලි මානසික ඒකාග්‍රතාවයක් අයදුම්කරුවන් සතුවිය යුතුය.

- වෙන්කර ඇති ලකුණු මත පදනම්ව, ප්‍රශ්නවලට කාලය වෙන්කර ගැනීමෙන් ප්‍රශ්න පත්‍රයේ දී ඇති ප්‍රශ්න වලට ඵලදායී අන්දමින් උත්තර සැපයීමට අයදුම්කරුවන්ට හැකිවනු ඇත.

- ප්‍රශ්න පත්‍රයේ දී ඇති ආකාරයටම උත්තරවලද යෝග්‍ය පරිදි නිවැරදි ලෙස අංක යෙදිය යුතුය.

- න්‍යායයන් හා ඒවා ප්‍රශ්නයට යොදාගැනීම අතර සම්බන්ධය වටහා ගැනීම ඉතාමත් වැදගත්වන අතර, ඉල්ලා ඇති අවස්ථාවන්හි උදාහරණ සහිතව ලිවිය යුතුය.

- උත්තර පොත් බාර දීමට පෙර, අවශ්‍යකරන ප්‍රශ්න සියල්ලටම උත්තර ලියා තිබේද, යෝග්‍ය පරිදි අංක යොදා තිබේදැයි දෙවරක් පරීක්ෂා කර බලන්න.

- * * * -